# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.04 පැය 1900 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1991/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**අම්බලන්ගොඩ පොලිස් වසමේදී වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට සැකකරුවන් පැමිණි කාර් රථයක් සොයා ගැනීම.**

2025.11.04 වන අද දින උදෑසන කාලයේ අම්බලන්ගොඩ පොලිස් වසමේ අම්බලන්ගොඩ නගර සභාව ආසන්න මාර්ගයේ යතුරුපැදියකින් ගමන් කරමින් සිටි පුද්ගලයෙකුට සිදු කරන ලද වෙඩි තැබීමකින් තුවාල ලබා ප්‍රතිකාර සඳහා බලපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මිය යන ලදී.

මෙම අපරාධය සඳහා සැකකරුවන් පැමිණි බවට සැකකරන කාර් රථයක් කරන්දෙණිය පොලිස් වසමේ එගොඩවෙල ප්‍රදේශයේ අතරහැර දමා ගොස් තිබියදී, විමර්ශන නිලධාරීන් විසින් සොයා ගෙන වැඩිදුර විමර්ශනය සඳහා අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා ඇල්පිටිය කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ අධීක්ෂණය යටතේ පොලිස් කණ්ඩායම් කිහිපයක් විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**